ISSN 1800-4067

# THE ROYAL ASIATIC SOCIETY OF SRI LANKA

## 3rd Research Conference
## March 27th - 28th 2009

# ABSTRACTS

Mahaweli Centre Auditorium
96, Ananda Coomaraswamy Mawatha
Colombo 07, Sri Lanka

# කොළඹ යන නමේ නිරුක්තිය සහ අර්ථය පිළිබඳ සොයා බැලීමක්

අනුර මනතුංග[1]

ශ්‍රී ලංකාවේ අගනුවර වූ කොළඹ නගරයේ නම ඇති වූ ආකාරය පිළිබඳව සොයා බැලීමක් මේ ලිපිය මඟින් සිදු කෙරේ. ඒ පිළිබඳව ඇති විවිධ ජනප්‍රවාද මෙහි දී විමසා බලන අතර, මතු දැක්වෙන අදහස එහි නිරුක්තිය සහ අර්ථය සම්බන්ධව වඩාත් තර්කානුකූල බව මෙයින් පෙන්වා දෙනු ලැබේ.

කොළඹ නගරයේ වඩාත් පුරාතන ජනාවාස පිහිටි ප්‍රදේශය 'නාකොළගම' යනුවෙන් අතීතයේ දී හඳුන්වනු ලැබ තිබේ. නාකොළගම යන්නේ 'නා' යන්න ලොප් වීමෙන් 'කොළගම' යනුවෙනුත් කොළගම යන්න කොළඹ යනුවෙනුත් විකාශය වී ඇති බව පෙනේ.

තවමත් කොළඹ නගරයේ ඇති නාගලගම් වීදිය යන්න නාකොළගම යන්නේ ප්‍රභේදයකි. නාකොළගම යන්නේ අර්ථය 'නාග-කුළ-ගම' ලෙස සැලකිය හැකිය. කොළඹට නුදුරු කැලණිය නාග ජනාවාසයක් ලෙස අතීතයේදී ප්‍රකටව තිබූ බව මෙහිදී සිහිපත් කළ යුතුය.

ප්‍රමුඛ පදඃ කොළඹ, නාකොළගම, නාගකුළගම, කැලණිය, නාග ජනාවාස
**Title:** An examination of the etymology and meaning of the name "Kolamba"
**Keywords:** Kolamba, Nakolagama, Nagakulagama, Kelaniya, Naga settlements

[1] ආසියාතු අධ්‍යයන මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: am@kln.ac.lk